සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2018 ජූලි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2018-07-21
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය සඳහන් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ශ්‍රී ලංකාවේ ශෙෂ්‍ය / පොදු (residuary / common) නීතිය වන්නේ:

(1) ඉංග්‍රීසි නීතිය. (2) රෝම ලන්දේසි නීතිය.
(3) තේසවලාමෙයි නීතිය. (4) උඩරට නීතිය.

1.2 සිවිල් වැරදි සහ කටයුතු (civil wrong and concerns), යුතුකම් කඩකිරීම් (breach of duties) (ගිවිසුම් තුලින් පැන නගින ඒවා හැර) පිළිබඳව කටයුතු කරන නීතිය හැඳින්වෙන්නේ:

(1) පවුල් නීතිය (Family Law) ලෙසයි. (2) භාර නීතිය (Trusts Law) ලෙසයි.
(3) දිළික්ත / තෝර්ත නීතිය (Torts Law) ලෙසයි. (4) ගිවිසුම් නීතිය (Contract Law) ලෙසයි.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ අවසාන අභියාචනාධිකරණය වන්නේ:

(1) මහේස්ත්‍රාත් අධිකරණයයි. (2) මහාධිකරණයයි.
(3) දිසා අධිකරණයයි. (4) ශ්‍රේෂ්ඨාධිකරණයයි.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ලිඛිතව ප්‍රකාශිත නියෝජ්‍යත්වය පැනනැගීම සඳහා ලියවිල්ලක් (document) ලෙස සලකනු **නොලබන්නේ** කුමක් ද?

(1) කොටස්හිමියෙකු විසින් ලබාදෙන ප්‍රතිපුරුෂ පත්‍රය (Proxy by a shareholder).

(2) ඇටර්නි බලපත්‍රය (Power of attorney).

(3) බලය පැවරීමේ ලිපිය (Letter of authority).

(4) තෑගි ඔප්පුව (Deed of gift).

1.5 කිසියම් පුද්ගලයෙකු, සේවකයෙකුද නැතහොත් නිදහස් ගිවිසුම්කරුවෙක්දැයි තීරණය කිරීම සම්බන්ධයෙන් වන පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවක භාරකාර අරමුදල (ETF), පාරිතෝෂික යනාදී ඇතැම් ප්‍රතිලාභ සහ සුරැකුම් සඳහා සේවකයන් පමණක් හිමිකම් ලබයි.

**(b)** සේවකයන්ගේ සේවා නියුක්තිය වෙනුවෙන් ආදායම් බදු නීතිය යටතේ උපයනවිට ගෙවීමේ බදු (PAYE) ගෙවීමට සේව්‍යයා බැඳී සිටී (liable).

**(c)** සේව්‍යයා බුන්වත් වුවහොත් (bankrupt) සේවකයන් හට හිඟ වැටුප්, සේවය අවසන් කිරීම සඳහා වන්දි වෙනුවෙන් ප්‍රමුඛතාවයක් (priority) නොමැත.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම වේ.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, විනිමය බිල්පතක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) එය ලිඛිත කොන්දේසි සහිත නියෝගයකි.

(2) එය දෙනු ලබන තැනැත්තා විසින් අත්සන් කරනු ලබන අතර, එයින් ආමන්ත්‍රණය කරනු ලැබ ඇති තැනැත්තා විසින් ගෙවනු ලැබීම අවශ්‍ය කෙරේ.

(3) ගෙවීම සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වා තිබීම.

(4) එය නිශ්චිත දිනකදී හෝ නිශ්චය කළ හැකි අනාගත දිනකදී හෝ ඉල්ලූ විට ගෙවන ලෙස ලියා තිබිය යුතුය.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත අනුව බුද්ධිමය දේපළක් ලෙස සලකනු **නොලබන්නේ** කුමක් ද?

(1) පේටන්ට් බලපත්‍රය (Patent). (2) වැඩෙන අස්වැන්න (Growing Crop).

(3) කාර්මික සැලසුම (Industrial Design). (4) පිටපත් අයිතිය (Copyright).

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.8 දිසා අධිකරණය මගින් හසුරුවනු ලබන සිවිල් ප්‍රශ්න (civil issues) දෙකක්(02) සඳහන් කරන්න.

1.9 චෙක්පතක ලක්ෂණ (features) දෙකක්(02) හඳුනා දක්වන්න.

1.10 2017 ජූලි 30 දින සංවිධානයකට අලුතෙන් බැඳුණු සේවකයෙකු 2018 වර්ෂයේදී වාර්ෂික නිවාඩු (annual leave) ලෙස හිමිකම් ලබන දින ගණන හඳුනා දක්වන්න. *(1954 අංක 19 දරණ සාප්පු සහ කාර්යාල සේවක පනත යටතේ මෙම සංවිධානය ආවරණය වෙතැයි උපකල්පනය කරන්න).* (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

කිලෝග්‍රෑමයක් රු.80/- බැගින් සීනි කිලෝග්‍රෑම් 1,000 ක් මිලදී ගැනීමට **සුනිල්** විසින් **පියල්ට** බලය ලබා දෙන ලදී. තොග වෙළෙඳපොළට ගිය **පියල්ට** දැනගැනීමට ලැබුණේ සීනි මිල ඉහළ ගොස් ඇති බවයි. කෙසේවෙතත්, **පියල්,** කිලෝග්‍රෑමයක් රු.100/- බැගින් සීනි කිලෝග්‍රෑම් 1,000 ක් **නිමල්ගෙන්** මිලදී ගන්නා ලදි. **පියල්** සීනි තොගය **සුනිල්** වෙනුවෙන් මිලදී ගන්නා බව සඳහන් නොකර, ඔහුගේ නමින්ම මිලදීගෙන තිබුණි. කෙසේවුවද, **සුනිල්** පසුව, මෙම ගනුදෙනුව සඳහා අපරානුමතිය (ratification) ලබාදෙන ලදි. ඊට පසුව, **පියල්, නිමල්ට** ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කළ අතර, ඔහු තමා වෙනුවෙන් සීනි මිලදී නොගත් බව පවසන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**නිමල්ට,** ඔහුගේ මුදල් නැවත අයකර ගැනීමට ඇති නෛතික හිමිකම **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

ගණකාධිකාරීන් විසින් මහජන සුභසිද්ධිය (interest of public) පිණිස ක්‍රියා කිරීමට ඇති වගකීම බාර ගැනීමට අවශ්‍ය කෙරේ. එමනිසා, තනි සේවාදායකයෙකුගේ හෝ සේවායෝජකයෙකුගේ අවශ්‍යතා සපුරාලීම පමණක් නොව මහජන සුභසිද්ධිය සපුරාලීමද ගණකාධිකාරීවරයෙකුගේ වගකීම වේ. මහජන සුභසිද්ධිය පිණිස ක්‍රියා කිරීම උදෙසා වෘත්තිය ආචාරධර්මයන්හි මූලික මූලධර්ම හයක් තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

වෘත්තිය ආචාරධර්මවල ඇති මූලික මූලධර්ම දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 04 වන ප්‍රශ්නය

**A, B** ගෙන් ණයක් ලබාගත් අතර, සුරැකුමක් වශයෙන් **B** නමින් ලියන ලද විධාන චෙක්පතක් (order cheque) දෙන ලදි. **B** එම චෙක්පත, සාමාන්‍ය රේඛනයකින් රේඛනය කරන ලදි. පසුව, මෙම රේඛනය කරන ලද චෙක්පත **C** විසින් සොරකම් කර බැංකුවේ කවුන්ටරයට ඉදිරිපත් කරන ලදි. චෙක්පතේ සඳහන් රේඛනය පිළිබඳ සැලිකිලිමත් නොවී බැංකුව, චෙක්පතේ වටිනාකම **C** ට ගෙවන ලදි. බැංකුවට එරෙහිව නඩුවක් පැවරීමට **A** බලාපොරොත්තු වෙයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**A** ට බැංකුවෙන් මුදල් නැවත අයකර ගැනීමට හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 05 වන ප්‍රශ්නය

2007 අංක 07 දරණ සමාගම් පනත, ශ්‍රී ලංකාවේ සමාගම් සඳහා අදාල වන ප්‍රධාන නීතිය, වේ. සමාගමකට විවිධ වූ ලක්ෂණ පවතින අතර, නෛතික පුද්ගලභාවය (legal personality) යනු එම ලක්ෂණයන්ගෙන් එකකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමාගමක් සම්බන්ධයෙන් තිබෙන නෛතික පුද්ගලභාවය යන සංකල්පය **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 06 වන ප්‍රශ්නය

**අමල්** සහ **රමල්, ඔටෝසෝන්** නමින් මෝටර් රථ මිලදී ගැනීමේ සහ විකිණීමේ හවුල් ව්‍යාපාරයක නියැලී සිටී. ඔවුන් අතර හවුල් ව්‍යාපාර ගිවිසුමක් නොතිබුණි. **අමල්** විසින් රු.50,000/- ක වට්ටමක් සහිතව හවුල් ව්‍යාපාරය වෙනුවෙන් මෝටර් රථයක් මිලදී ගන්නා ලදි. කෙසේවුවද, ඔහු එම වට්ටම පිළිබඳව **රමල්ට** හෙළිදරව් නොකළ අතර, එම ගනුදෙනුව තුළින් රු.50,000/- ක රහස්‍ය ලාභයක් උපයන ලදි. පසුව **රමල්** මෙම රහස්‍ය ලාභය පිළිබඳව අනාවරණය කර ගන්නා ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**රමල්ගේ** නෛතික හිමිකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

(a) *"මුහුදු බණිජ මිශ්‍ර ආලේපනයක්"* ලෙස විස්තර කරන ලද රූපලාවන්‍ය ආලේපන ඇසුරුමක් **රාණි** වෙත විකිණීමට **රාජා** එකඟ වූ අතර, එය නියැදියට (sample) සමාන බවට ඔහු සහතික විය. නියැදියට සමාන වූ රූපලාවන්‍ය ආලේපන ඇසුරුමක් **රාජා** විසින් **රාණි** වෙත බාරදුන් නමුත් ආලේපනයේ අන්තර්ගතයට මුහුදු බණිජ මිශ්‍රව නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මේ සම්බන්ධයෙන් **රාණිගේ** නෛතික හිමිකම් පිළිබඳව **විමසන්න**. (ලකුණු 05)

(b) ජපානයෙන් මෝටර් රථ පහක් ආනයනය කිරීමට **හසන්ට** අවශ්‍යව ඇත. ඔබ **හසන්ගේ** බැංකුකරු වේ. අන්තර්ජාතික වෙළඳාමේදී භාවිත කළයුතු ගෙවීමේ ක්‍රමයක් තෝරාගැනීම සම්බන්ධයෙන් **හසන්** ඔබගෙන් උපදෙස් පතයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**හසන්** ට භාවිත කළ හැකි සුදුසු ගෙවීමේ ක්‍රමයක් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

### 08 වන ප්‍රශ්නය

**අමාලි** සහ **සුනාලි** හොඳම මිතුරියන් වේ. **සීමාසහිත රිච් ලයිෆ් රක්ෂණ සමාගම** විසින් පවත්වන ලද සම්මන්ත්‍රණයකට ඔවුන් සහභාගී විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, **අමාලිට** තමාගේ සහ තම සැමියා වන **සුමිත්ගේ** ජීවිත රක්ෂණය කිරීම සඳහා ජීවිත රක්ෂණ ඔප්පු ලබාගැනීමට අවශ්‍ය විය. එසේම, **සුනාලිට** ද තම වැඩිමහල් සොහොයුරා වන **සමත්** සහ තම දෙමාපියන්ගේ ජීවිත රක්ෂණය කිරීම සඳහා රක්ෂණ ඔප්පු ලබා ගැනීමට අවශ්‍ය විය.

**අමාලි** සහ **සුනාලි** යන දෙදෙනාම ඉහත කී අරමුණු සඳහා අයදුම් කළ අතර, **සුනාලි** විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කරන ලදි. **අමාලිගේ** අයදුම්පත් පිළිබඳව රක්ෂණ සමාගම් කාර්යාලය තවමත් තීරණයකට එළඹ නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **අමාලි** විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සාර්ථක වනු ඇත්දැයි **විමසන්න**. (ලකුණු 05)

(b) **සුනාලි** විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට හේතු **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

### 09 වන ප්‍රශ්නය

(a) 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරී පනත විසින් පාරිභෝගික කටයුතු අධිකාරිය (Consumer Affairs Authority) ස්ථාපනය කිරීම සිදුකරන ලදි. පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් වෙළෙන්දන් කෙරෙහි ඇතැම් වගකීම් (obligations) පනවනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පාරිභෝගික කටයුතු අධිකාරියේ ප්‍රධාන කාර්යයන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් පනවා ඇති පරිදි වෙළෙන්දන්ගේ වගකීම් (obligations) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සේවක අර්ථසාධක අරමුදල් (EPF) පනතේ අරමුණ වන්නේ දායකත්ව අර්ථසාධක අරමුදලක් හරහා සේවකයන්ගේ විශ්‍රාමික වරප්‍රසාදයන් සහතික කිරීමයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පුද්ගලයෙකුට ඔහුගේ / ඇයගේ සේවක අර්ථසාධක අරමුදල් සඳහා හිමිකම්පෑමට අයිතිවාසිකම් තිබෙන අවස්ථා හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

(a) **මාලා** විසින් ඇයගේ නිවස රු. මිලියන 2 කට **කුමාරිට** විකිණීමට අර්පණය කරන ලදි. **කුමාරි** නිවස රු. මිලියන 2 කට තමා මිලදී ගන්නා බවත්, එහෙත් තමා ගෙවීම් කරනු ලබන්නේ එකක් රු. මිලියන 0.5 බැගින් වූ වාරික හතරකින් (04) බවත් පවසන ලදි. වාරික මගින් ගෙවීම් ලබා ගැනීම **මාලා** විසින් ප්‍රතික්ෂේප කරන ලදි. එවිට රු. මිලියන 2 ක් වූ සම්පූර්ණ ප්‍රතිජ්ඨාවම එකවර ගෙවීමට **කුමාරි** එකඟ වූවාය. එහෙත් **මාලා, කුමාරිට** නිවස විකිණීම ප්‍රතික්ෂේප කරන ලදි.

**මාලාගේ** සහෝදරයා වන **පියල්** ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය පිළිබඳ පර්යේෂණයක් කරමින් සිටී. ඔහු ගාල්ලේ ප්‍රධාන වාර්ෂික පෙරහැර නැරඹීමට ගාල්ලේ **පැරඩයිස් හෝටලයේ** කාමරයක් වෙන්කර ගන්නා ලදි. ආරක්ෂක ප්‍රශ්නයක් මත පෙරහැර පැවැත්වීම අවලංගු කරන ලදි. **පියල්** කාමරය වෙන්කර ගැනීම මත ගෙවූ මුදල් නැවත ගෙවන ලෙස හෝටලයෙන් ඉල්ලා සිටින ලදි. හෝටලය විසින් **පියල්ගේ** ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද අතර, වෙන්කරගත් දිනයේදී හෝටලයේ නවාතැන් ගන්නා ලෙස ඔහුට දන්වන ලදි. හෝටලයේ තීරණය පිළිබඳ **පියල්** බලාපොරොත්තු කඩවී සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **විමසන්න**:

(i) **මාලා** සහ **කුමාරි** අතර වලංගු ගිවිසුමක් තිබේද යන වග. (ලකුණු 08)

(ii) හෝටල් කාමරය වෙන්කර ගැනීම සඳහා ඔහු කළ ගෙවීම සම්බන්ධයෙන් **පියල්ගේ** නෛතික හිමිකම. (ලකුණු 06)

(b) **කුසල්,** ස්කැනර් යන්ත්‍ර (scanners), යතුරු පුවරු (key boards) සහ මුද්‍රණ යන්ත්‍ර (printers) වැනි පරිගණක උපාංග සහ විදුලි උපකරණ බෙදා හරින්නෙකි. **මායා, රවිඳු** සහ **දයාල්** යන ගනුදෙනුකරුවන් තිදෙනා 2018 මාර්තු 30 දින **කුසල්ගේ** වෙළෙඳසැලට පැමිණි අතර, පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

- **කුසල්, මායාට** ස්කැනර් යන්ත්‍රයක් විකිණීමට එකඟ විය. ඇය විසින් ඇණවුම සිදුකළ අවස්ථාවේදී, ඇය බලාපොරොත්තු වී සිටි නිශ්චිත මාදිලියේ (exact model) ස්කැනර් යන්ත්‍රයක් ඔහුගේ තොගයේ නොතිබුණි. නිශ්චිත මාදිලියේ ස්කැනර් යන්ත්‍රයක් මාසයකට පසුව ආනයනය කරදෙන බවට ඔහු විසින් ඇයට පොරොන්දු විය.
- එදිනම **රවිඳු** යතුරු පුවරුවක් **කුසල්ගෙන්** ඇණවුම්කළ අතර, එම යතුරු පුවරුව අදාල දිනයේදීම **රවිඳු** වෙත බාරදෙන ලදි.
- එදිනම මුද්‍රණ යන්ත්‍රයක් **දයාල්ට** විකිණීමට **කුසල්** එකඟ වූ අතර, අලුත් අවුරුදු උත්සව දිනට, දින 3 කට පෙර එය බාරදීමට ඔහු පොරොන්දු විය. **දයාල්** සම්පූර්ණ මුදලම ගෙවූ නමුත් පොරොන්දු වූ පරිදි මුද්‍රණ යන්ත්‍රය බාරදීම **කුසල්** විසින් පැහැර හරින ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) **කුසල්** සහ **මායා** අතර, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් තිබේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(ii) **කුසල්** සහ **රවිඳු** අතර, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් තිබේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(iii) ගැනුම්කරුවෙකු ලෙස, **දයාල්ට** ඇති නෛතික හිමිකම් සහ ප්‍රතිකර්ම (remedies) **විමසන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |